# 2022 වසරේ අර්බුදයට ප්‍රතිචාර ලෙස සම්පාදිත ප්‍රතිපත්ති සම්බන්ධව ශ්‍රී ලංකා රජයේ කැපවීම ඇගයීම

March 2023

© Verité Research

# අන්තර්ගතය


**පසුබිම** ........ 3

**එය ක්‍රියා කරන ආකාරය** ........ 3

  විවෘතභාවය ........ 3

  ප්‍රගතිය ........ 4

සොයා ගැනීම් ........ 4

  විවෘතභාවය ........ 4

  ප්‍රගතිය ........ 5

**සොයාගැනීම් විස්තරාත්මකව** ........ 6

**වගකීම්භරණය** ........ 23

# පසුබිම

ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික අබර්ධුදය සහ සමාජ-දේශපාලන කැලඹීම එහි පුරවැසියන්ට බරපතල ප්‍රතිවිපාක ඇති කර තිබේ. මෙම අබර්ධුදයේ ප්‍රධානතම ලක්ෂණ තුන වන්නේ: අත්‍යවශ්‍ය ඖෂධ ද්‍රව්‍ය හිඟකම, දිනෙන් දින වැඩි වන ආහාර උද්ධමනය සහ පුරවැසියන් මාස ගණනක් ගමනාගමනයෙන් දුරස් කර තැබූ ඉන්ධන හිඟකමයි.

මෙම පසුබිම තුළ, 2022 වසරේ පළමු අධර්යේදී මෙම ගැටළු තුන නිරාකරණය කිරීමට යෝජනා කරන ලද ප්‍රතිපත්ති රජය විසින් කෙතරම් හොඳින් ක්‍රියාත්මක කළේද යන්න ඇගයීමට වෙරිටේ රිසර්ච් කටයුතු කළේය.

අරමුණු වූයේ:

- රජයේ තීරණ ගැනීම සහ එහි පසුකාලීන අනුගමනය කිරීම් පිළිබඳ විනිවිදභාවය වැඩි දියුණු කිරීම; සහ
- රජය සහ එය වටා ඇති විශාල නිලධාරී තන්ත්‍ර ජාලය වගවීමට ලක් කිරීම.

# එය ක්‍රියා කරන ආකාරය

මෙම ඇගයීමේදී අමාත්‍ය මණ්ඩල තීරණ සහ රජයේ පාලරීමේන්තු මන්ත්‍රීවරුන් විසින් හඳුන්වා දුන් යෝජනා 15 ක් නිරීක්සුමට ලක් කරන ලදී. සෞඛ්‍ය සහ ඖෂධ, ආහාර සහ කෘෂිකමර්ය සහ ඉන්ධන සහ බලශක්තිය යන ක්ෂේත්‍රවලට අයත් ප්‍රතිපත්තිවලට අදාළව පාලරීමේන්තු හැන්සාඩ් වාතර්ාවේ සහ අමාත්‍ය මණ්ඩල තීරණ මාගර්ගත(Online) පළ කිරීම්වල භාවිතා කරන ලදී.

නිරීක්ෂනය කළ එම සියලු තීරණ, විවෘතභාවය සහ ප්‍රගතිය යන දශර්ක දෙකක් භාවිතයෙන් ඇගයීමට ලක් කරන ලදී:

පයෙර්ෂණ කණ්ඩායම මෙම තීරණ වලට අදාළ තොරතුරු ප්‍රගාමීව අන්තජර්ාලයට එක් කර ඇත්දැයි පරීක්ශා කළ අතර මූලික වශයෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වන පනත හරහා නියෝජිතායතනවල ගොනු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් වලින් තොරතුරු රැස්කර ගෙන ඇත. 2022 නොවැම්බර් 4 දින ඉල්ලීම් ගොනුගත කෙරිණි. රට තුළ පැවති අබර්ධුධකාරී තත්වය හේතුවෙන්, 2022 දෙසැම්බර් 16 වන තෙක් මාස 1.5 ක් දක්වා කාලයක් පුරා නියෝජිතායතන වෙතින් ඇගයීම් සඳහා තොරතුරු භාරගන්නා ලදී. මෙම කාලසීමාවට පසුව ලැබුණු කිසිදු තොරතුරක් ඇගයීම සඳහා සලකා බලනු නොලැබීය.

## විවෘතභාවය

මෙමගින් රජය විසින් තමන් කුමක් කරන්නේදැයි, පවසන ප්‍රමාණය ඇගයීමකට ලක් කෙරේ. එමගින් එක් එක් තීරණය/යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු රජය විසින් අනාවරණය කිරීමේ මට්ටම මනිනු ලැබේ. කෙටියෙන් පවසන්නේ නම් මෙම දශර්කය මගින් විනිවිදභාවය ඇගයීමකට ලක් කෙරේ.

ඇගයීම කරන වේලාවේ ලැබී ඇති තොරතුරු මත පදනම්ව විවෘතභාවය ඇගයෙන අතර එය පහත පරිදි වගර්ීකරණය කෙරේ:

**ආවෘත:** සම්පූණර් ඇගයීම් කාල පරාසය තුළ ප්‍රගතිය මැනීමට කිසිදු තොරතුරක් නොලැබුණි සහ/හෝ කාලීනව තොරතුරු සැපයුවේ නැත

**සීමිත:** සම්පූණර් ඇගයීම් කාල පරාසය තුළ ප්‍රගතිය මැනීමට ප්‍රමාණවත් තොරතුරු නොලැබුණි සහ/හෝ කාලීනව තොරතුරු සැපයුවේ නැත

**විවෘත:** සම්පූර්ණ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමී ලෙස අනාවරණය කරන ලදී නැතහොත් ඉල්ලීම අනුව ලබා දෙන ලදී සහ/හෝ කාලීනව ලබා දෙන ලදී.

## ප්‍රගතිය

මෙමගින් රජය තමන් කරන්නේ යැයි පවසන දේ කෙතරම් දුරට රජය විසින් ඉටු කරන්නේද යන්න ඇගයීමකට ලක් කෙරේ. ස්ථාපිත කාල රේඛාවන් සහ සන්ධිස්ථාන මත පදනම්ව යෝජනා සහ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ලා රජයේ ප්‍රගතිය ඇගයීමට ලක් කරයි.

ප්‍රගතිය පහත පරිදි වගරීකරණය කෙරේ.


| | | |
|---|---|---|
| **ආවෘත** | කිසිදු තොරතුරක් නොමැත හෝ ලද තොරතුරු භාවිතා කළ නොහැක |
| **දුර්වලයි** | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 25% ට වඩා අඩුය |
| **අර්ධ සම්පූර්ණයි** | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 25%- 50% අතර වේ |
| **සැළකිය යුතුයි** | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 50%- 80% අතර වේ |
| **ඉටු කරන ලදී** | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 80% වැඩි ය |

# සොයා ගැනීම්

## විවෘතභාවය

අධ්‍යනය කළ යෝජනා 15, නියෝජිතායතන නවයක් යටතට ගැනෙන අතර, ඉන් නියෝජිතායතනයක්වත් ප්‍රගාමීව අන්තජර්ාලයට මෙම යෝජනාවල ප්‍රගතිය එක්කර නැත.

තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් ගොනු කළ පසුවද ප්‍රතිචාර ලැබුණේ අදාළ නියෝජිතායතනවලින් තුනකින් පමණි (20%). තවද ලැබුණු ප්‍රතිචාර අතුරින්, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් වූයේ එක් නියෝජිතායතනයකින් සපයන ලද තොරතුරු (7%) පමණක් වූ අතර අනෙක් ආයතන දෙකෙන් ලද තොරතුරු (13%) ඇගයීම් අරමුණුවලට අදාළ නොවූ හෝ ප්‍රයෝජනවත් නොවූ ඒවා විය.





*ප්‍රදශර්කය 1: අධ්‍යනය කළ යෝජනා 15 "විවෘතභාවය" වගරීකරණය*

## ප්‍රගතිය

යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම පිණිස ප්‍රමාණවත් තොරතුරු ලැබුණේ එක් යෝජනාවකට පමණි (7%). එනම් "අක්‍රීය වූ වී වගා ණය කපා හැරීම".සම්බන්ධව වූ යෝජනාවයි. ලද තොරතුරු වලට අනුව, පයෙර්ෂණ කණ්ඩායම නිගමනය කළේ මෙම යෝජනාව "**ඉටු කරන ලද**" ලෙස වගරීකරණය කළ හැකි බවයි.

නිරීක්ශනය කළ යෝජනා අතුරින් 93% කටම අදාළ තොරතුරු හෙළිදරවු කර නොමැත.




*ප්‍රදශර්කය 2: නිරීක්ශනය කළ යෝජනා 15 "ප්‍රගතිය" වගරීකරණය*

## සොයා ගැනීම් විස්තරාත්මකව

| යෝජනාව/ අමාත්‍ය මණ්ඩල තීරණය | යෝජනාවේ විස්තර | විවෘතභාවය | ප්‍රගතිය | තොරතුරු දැනගැනිමේ අයිතිවාසිකම් පත්‍රය සම්බන්ධ අදහස් දැක්වීම් | රජයේ නියෝජිතායතනය |
|---|---|---|---|---|---|
| සැමට විදුලිය | ශ්‍රී ලංකා පාලර්මේන්තුවේ 2022.01.19 දිනැති පාලර්මේන්තු හැන්සාඩ් වාතර්ාවේ පිටු අංක 14 තුළ සඳහන් වන පරිදි ජනතාවට තම එදිනෙදා කටයුතු සිදු කිරීම සඳහා වන ප්‍රධාන අවශ්‍යතාවයක් වන විදුලිය සැපයීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව ගරු ඉසුරු දොඩංගොඩ ප්‍රකාශ කර ඇත. අඩු ආදායම්ලාභී පවුල්වලට විදුලිය සැපයීම වැඩි කිරීම පිණිස “සැමට විදුලිය” නම් වූ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි. | සීමිත | හෙළිදරවු කර නොමැත<br><br>ලැබුණු තොරතුරු යෝජනාවට අදාළ නොවූ බැවින් ප්‍රගතිය ඇගයීමට නොහැකි විය. (තොරතුරු ලබාදෙනු ලැබුවේ “දැයට එළිය” නම් වූ වෙනත් වැඩසටහනක් සම්බන්ධවය) | 2022.11.04 - බලශක්ති අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනිමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර බලශක්ති අමාත්‍යාංශය ප්‍රතිචාර දැක්වීමට දින 14 ක් ඉල්ලා සිටියේය.<br><br>2022.11.17 - ඉල්ලීම ලැබුණු බව දන්වා 2022.11.10 දිනැතිව ලිපියක් ලැබිණි.<br><br>2022. 11.23 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර ඔවුන් දැනටමත් තොරතුරු තැපෑලෙන් එවූ බව දන්වන ලදී.<br><br>2022.11.25 - තැපෑලෙන් තොරතුරු ලැබිණි. | විදුලි බල අමාත්‍යාංශය |
| ඉන්ධන මිල වැඩි වීමෙන් බලපෑම්ලත් ධීවර සහ ප්‍රවාහන අංශවලට විශේෂ සහන වැඩසටහනක් | ශ්‍රී ලංකා පාලර්මේන්තුවේ 2022.04.19 දිනැති හැන්සාඩ් වාතර්ාවේ 81 වන පිටුවේ සඳහන් වන පරිදි, ගරු කාංචන විජේසේකර මහතා පවසා ඇත්තේ ධීවර සහ ප්‍රවාහන වැනි අංශ සඳහා විශේෂ සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර ඇති බවයි. ලෝක වෙළෙඳපොළේ බොර තෙල් මිල සහ ඩොලර් අනුපාතය සලකා බලමින් ඉන්ධන මිල වැඩි කිරීම වැදගත් වන බව පවසන ඔහු, විදුලිය කැපීම අවසන් කිරීමට සහ බාධාවකින් තොරව | ආවෘත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - විදුලි බල අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනිමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර තොරතුරු දැනගැනීමේ ඉල්ලීම බලශක්ති අමාත්‍යාංශයේ ඛනිජ තෙල් | විදුලි බල අමාත්‍යාංශය/ බලශක්ති අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විදුලිය සැපයීමට ඉදිරි ක්‍රියාමාගර් සැලසුම් කිරීමේදී බොර තෙල් ඇණවුම් කිරීම අත්‍යවශ්‍ය බවද සඳහන් කර ඇත. ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවේ බොරතෙල් ඇනවුම් සඳහා වන වියදම් පියවා ගැනීම සඳහා ඉන්ධන මිල ඉහළ දැමීමට රජය බැඳී සිටින බව ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේ වෙතත් අමාත්‍යවරයා ප්‍රකාශ කළ පරිදි ධීවර සහ ප්‍රවාහන වැනි ක්ෂේත්‍ර සඳහා විශේෂ සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර තිබිණි. | | | අංශයට යොමු කරන ලද බව දැනුම් දෙනු ලැබීය.<br><br>2022.11.23 - බලශක්ති අමාත්‍යාංශයේ බනිජ තෙල් අංශය අමතනු ලැබුවද ඔවුන්ට එවැනි ඉල්ලීමක් නොලැබුණු බව දන්වන ලදී.<br><br>2022.12.02 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර බලශක්ති අමාත්‍යාංශයට එම තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ලැබී නොතිබිණි.<br><br>තොරතුරු කිසිවක් නොලැබිණි. | |
| පුනජර්නනීය බලශක්තිය තුළින් ස්වයං පෝෂිත විදුලි උත්පාදනයක් අත්පත් කරගැනීම | 2022.03.10 දිනැති ශ්‍රී ලංකා පාලර්මේන්ත් හැන්සාඩ් වාතර්ාවේ 55 පිටුවේ සඳහන් පරිදි ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මිය පවසා ඇත්තේ 2030 වන විට හැකිතාක් පුනජර්නනීය බලශක්ති ප්‍රභව යොදා ගනිමින් විදුලිය නිෂ්පාදනය කිරීමේ අරමුණින් විදුලිබල අමාත්‍යාංශය ක්‍රියාත්මක වන බවත් සූයර් තාප සහ සුළං බලාගාර යොදා ගනිමින් ජාතික පද්ධතියට පුනජර්නනීය බලශක්තිය එක් කළ යුතු බවත්ය. අවම වශයෙන් තවත් මෙගාවොට් 1000ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර මේ රට පුනජර්නනීය බලශක්තියෙන් ස්වයංපෝෂිත රටක් බවට පත් කිරීමට කටයුතු කරමින් සිටින බවද ඇය වැඩිදුරටත් සඳහන් කළාය. | සීමිත<br><br>ලැබුණු තොරතුරු යොමු කළ යෝජනාවට අදාළ නොවන අතර එබැවින් ඇගයීමක් සිදු කිරීම සඳහා භාවිතා කළ නොහැකි විය. | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - විදුලි බල අමාත්‍යාංශයට තොරතුටු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15- පසුවිපරම් කිරීමට අමතන ලද අතර විදුලි බල අමාත්‍යාංශය දින 14 ක් ඉල්ලා සිටියේය.<br><br>2022.11.17 - ඉල්ලීම ලැබුණු බව දන්වා 2022.11.10 දිනැතිව විදුලි බල අමාත්‍යාංශයෙන් ලිපියක් ලැබිණි.<br><br>2022.11.23 - පසුවිපරම් කිරීමට අමතනු ලැබූ අතර ඔවුන්ගේ ප්‍රතිචාර තැපැල් මගින් එවූ බවට දන්වන ලදී. | විදුලි බල අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.11.25 - වෙරිටේ වෙත තැපැල් මගින් ප්‍රතිචාරයක් ලැබිණි. | |
| අඩු ආදායම්ලාභී කණ්ඩායම්, වතුකරයේ කම්කරුවන් සහ ධීවරයින් අතර භූමිතෙල් බෙදා හැරීමේ වැඩසටහන | 2022.05.18 දින ශ්‍රී ලංකා පාලර්මේන්තුවේ හැන්සාඩ් පත්‍රයේ පිටු අංක 10 හි සඳහන් පරිදි රටේ භූමිතෙල් හිඟයට පිළියමක් ලෙස අඩු ආදායම්ලාභී කණ්ඩායම්, වතුකරයේ කම්කරුවන් සහ ධීවරයින් අතර භූමිතෙල් බෙදා හැරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ගරු කංචන විජේසේකර මහතා යෝජනා කර ඇත. ඉන්ධන පිරවුම්හල්වල මැදිහත්වීමකින් තොරව ඉලක්කගත ජනතාව වෙත සෘජුවම සහනාධාරයක් ලෙස භූමිතෙල් සැපයීම ඉහත වැඩසටහනේ අරමුණ විය. බස් රථ හිමියන් වැනි පුද්ගලයින් භූමිතෙල් තොග ගබඩා කර තැබීම සම්බන්ධයෙන් සොයා බැලීමට පියවර ගන්නා බව ද අමාත්‍යවරයා අවධාරණය කළේය. | ආවෘත | හෙළිදරව් කර නොමැත | 2022.11.04 - විදුලි බල අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර තොරතුරු දැනගැනීමේ ඉල්ලීම බලශක්ති අමාත්‍යාංශයේ ඛනිජ තෙල් අංශයට යොමු කරන ලද බව දැනුම් දෙනු ලැබීය.<br><br>2022.11.23 - බලශක්ති අමාත්‍යාංශයේ ඛනිජ තෙල් අංශය අමතනු ලැබුවද ඔවුන්ට එවැනි ඉල්ලීමක් නොලැබුණු බව දන්වන ලදී.<br><br>2022.12.02 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර බලශක්ති අමාත්‍යාංශයට එම තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ලැබී නොතිබිණි.<br><br>තොරතුරු කිසිවක් නොලැබිණි. | විදුලි බල අමාත්‍යාංශය / බලශක්ති අමාත්‍යාංශය |
| | | | | | |

| | | ආවෘත | හෙළිදරවු කර නොමැත | | |
|---|---|---|---|---|---|
| මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2021/22 | 2021/2022 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ගොවීන්ගේ අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබාදීම සහ වී තොගයක් පවත්වාගෙන යාම අරමුණු කළේය. වී අස්වැන්න මිලදී ගැනීම කුඩා හා මධ්‍ය පරිමාණ මෝල්කරුවන් හරහා වී අලෙවි මණ්ඩලය සහ දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් විසින් සෘජුවම සිදුකිරීමට නියමිතව තිබුණි. වී අස්වනු මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන රුපියල් මිලියන 29,805 ක මුදල රජයේ බැංකු හරහා ලබා ගැනීමට නියමිත ව තිබිණි. ඒ අනුව, කෘෂිකමර් අමාත්‍යාංශය විසින් සිදු කළ යෝජනාවන් සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය පහත තීරණ ගන්නා ලදී: (i) 2021/2022 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පුද්ගලික අංශය සමග තරඟකාරී මිල ගණන් යටතේ වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීම; (ii) 2021/2022 මහ කන්නයේ වී අස්වැන්න අඩුවීම නිසා පීඩාවට පත් ගොවීන්ගේ ආදායම් මට්ටම සුරක්ෂිත කිරීම සඳහා කිලෝග්‍රෑමයකට රු.25/-. බැගින් වන්දි ගෙවීම | | | 2022.11.04 - වී අලෙවි මණ්ඩලය වෙත තොරතුරු දැනගැනිමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ ඔවුන් තවමත් ඉල්ලූ දත්ත රැස් කරමින් සිටින බවත් සතියකින් අප වෙත අදාළ තොරතුරු ලබා දෙන බවත් ය..<br><br>2022.11.22 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ දින දෙකක් ඇතුළත් යාවත් කළ හැකි බවත් තොරතුරු දැනගැනිමේ ඉල්ලීම වැඩි දුර විස්තර සඳහා කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කිරීමට අවශ්‍ය වනු ඇති බවත් ය.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට ඇමතිමේදී, තොරතුරු සූදානම් බවත් 2022.12.01 වන විට වෙරිටේ වෙත එවන බවත් සඳහන් කෙරිණි.<br><br>2022.12.08- පසු විපරම් කිරීමට ඇමතිමේදී, 2022.12.09 වන විට වෙරිටේ වෙත ඊමේල් සහ තැපැල මගින් එවන බවත් සඳහන් කෙරිණි.<br><br>2022.12.13 -පසු විපරම් කිරීමට ඇමතූ අතර තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් තුනෙන් එකකට තොරතුරු ලබා දෙන බවත් ඉතිරි ඉල්ලීම් දෙක සම්බන්ධ තොරතුරු කෘෂිකමර් අමාත්‍යාංශයෙන් ලබා දිය යුතු බවත් දැනුම් දෙනු ලැබිණි. | වී අලෙවි මණ්ඩලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.15 - පසුවිපරම් සඳහා අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි.<br><br>තොරතුරු නොලැබිණි | |
| 2021/22 මහ කන්නයේ හරිත කෘෂි යෙදවුම් භාවිතය සඳහා දිරි දීමනා ගෙවීමේ ක්‍රමවේදය | 2021/2022 මහ කන්නයේ දී අස්වැන්න අඩුවීමෙන් පීඩාවට පත් ගොවීන්ගේ ආදායම් මට්ටම ශක්තිමත් කිරීමේ අරමුණින් වී කිලෝවකට රුපියල් 25/- ක වන්දි මුදලක් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණි. ඒ අනුව, අක්කර 05 ක උපරිම වගා බිම් ප්‍රමාණය සඳහා අදාළ නිර්ණායකය මත ගණනය කරන ලද වන්දි මුදල දිරිගැන්වීමක් ලෙස ප්‍රදානය කිරීමටත්, සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන්ට මෙන්ම යැපුම් මට්ටමේ කුඩා පරිමාණ ගොවීන්ට ලබා දීමටත් ක්‍රමවේදයක් සකස් කරන ලදී. එබැවින් එකී ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට සහ එම අරමුණ සඳහා අවශ්‍ය අරමුදල් කාබනික පොහොර, වී සහ ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු සහ අතර්ාපල් වගාව ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය සහ උසස් තාක්ෂණ කෘෂිකමර්ාන්තය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ සහ නියාමනය කිරීමේ රාජ්‍ය අමාත්‍යාංශයෙන් ගොවිජන සංවර්ධන දෙපාතර්මේන්තුවට සැපයීම පිණිස වන යෝජනාවට කෘෂිකමර් අමාත්‍යාංශය අනුමත කරන ලදී. | ආවෘත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - වී අලෙවි මණ්ඩලය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ ඔවුන් තවමත් ඉල්ලූ දත්ත රැස් කරමින් සිටින බවත් සතියකින් අප වෙත අදාළ තොරතුරු ලබා දෙන බවත් ය..<br><br>2022.11.22 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ දින දෙකක් ඇතුළත් යාවත් කළ හැකි බවත් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම වැඩි දුර විස්තර සඳහා කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කිරීමට අවශ්‍ය වනු ඇති බවත් ය.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට ඇමතිමේදී, තොරතුරු සූදානම් බවත් 2022.12.01 වන විට වෙරිටේ වෙත එවන බවත් සඳහන් කෙරිණි.<br><br>2022.12.08- පසු විපරම් කිරීමට ඇමතිමේදී, 2022.12.09 වන විට වෙරිටේ වෙත ඊමේල් සහ තැපැල මගින් එවන බවත් සඳහන් කෙරිණි. | වී අලෙවි මණ්ඩලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.13 -පසු විපරම් කිරීමට ඇමතූ අතර තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් තුනෙන් එකකට තොරතුරු ලබා දෙන බවත් ඉතිරි ඉල්ලීම් දෙක සම්බන්ධ තොරතුරු කෘෂිකමර් අමාත්‍යාංශයෙන් ලබා දිය යුතු බවත් දැනුම් දෙනු ලැබිණි.<br><br>2022.12.15 - පසුවිපරම් සඳහා අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි.<br><br>තොරතුරු නොලැබිණි | |
| 2022/23 මහ කන්නයේ වී වගාව සඳහා පොහොර ආනයනය කර බෙදා හැරීම | 2022/23 මහ කන්නයේ වී හෙක්ටයාර් ලක්ෂ 8ක් අස්වැද්දීමට අපේක්ෂාව සඳහා පොහොර ලබාදීමට කටයුතු කළ යුතුව තිබුණි. 2022/23 මහ කන්නයේ වී වගාව සඳහා යූරියා මෙට්‍රික් ටොන් 150,000 ක්, මියුරේට් ඔෆ් පොටෑෂ් මෙට්‍රික් ටොන් 45,000 ක් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් මෙට්‍රික් ටොන් 36,000 ක් අවශ්‍ය බව ගණන් බලා ඇත. ඒ අනුව සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමෂර්ල් පොහොර සමාගම හරහා අවශ්‍ය පොහොර තොග ආනයනය කර ගොවීන් වෙත බෙදා හැරීමට කෘෂිකමර් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | ආවෘත | හෙළිදරව් කර නොමැත | 2022.11.04 - වී අලෙවි මණ්ඩලය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ ඔවුන් තවමත් ඉල්ලූ දත්ත රැස් කරමින් සිටින බවත් සතියකින් අප වෙත අදාළ තොරතුරු ලබා දෙන බවත් ය..<br><br>2022.11.22 - පසු විපරම් කිරීමට ඇමතූ අතර වී අලෙවි මණ්ඩලය ප්‍රකාශ කළේ දින දෙකක් ඇතුළත් යාවත් කළ හැකි බවත් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම වැඩි දුර විස්තර සඳහා කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කිරීමට අවශ්‍ය වනු ඇති බවත් ය.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට ඇමතිමේදී, තොරතුරු සූදානම් බවත් 2022.12.01 වන විට වෙරිටේ වෙත එවන බවත් සඳහන් කෙරිණි. | වී අලෙවි මණ්ඩලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.08- පසු විපරම් කිරීමට ඇමතිමේදී, 2022.12.09 වන විට වෙරිටේ වෙත ඊමේල් සහ තැපැල මගින් එවන බවත් සඳහන් කෙරිණි.<br><br>2022.12.13 -පසු විපරම් කිරීමට ඇමතූ අතර තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් තුනෙන් එකකට තොරතුරු ලබා දෙන බවත් ඉතිරි ඉල්ලීම් දෙක සම්බන්ධ තොරතුරු කෘෂිකමර් අමාත්‍යාංශයෙන් ලබා දිය යුතු බවත් දැනුම් දෙනු ලැබිණි.<br><br>2022.12.15 - පසුවිපරම් සඳහා අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි.<br><br>තොරතුරු නොලැබිණි | |
| රාජ්‍ය අංශයට Sterile Liquid Small Volume Parenteral - SLSVP එන්නත් මිලදී ගැනීම | රජය දළ වශයෙන් Sterile Liquid Small Volume Parenterals (SLSVP) එන්නත් මිලදී ගැනීම සඳහා වාෂරීකව රුපියල් මිලියන 3,000 (ඇ.ඩො. මිලියන 15ක් පමණ) වියදම් කරයි. වාෂරීකව මෙම එන්නත් මිලියන 50ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇති කමර්ාන්ත ශාලාවක් පල්ලෙකැලේ ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට M/s Kelun Lifesciences (Pvt) Ltd සමාගම වෙත රජයේ අනුමැතිය ලබා දෙන ලදී. අදාළ ප්‍රමිතීන්ට අනුකූලව SLSVP නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇති දිවයිනේ එකම සමාගම වන මෙම සමාගම 2022 පෙබරවාරි මාසයේ සිට සිය නිෂ්පාදන සැපයීමට සූදානම්ව සිටී. ඒ අනුව, රජයේ අවශ්‍යතා සපුරාලීම සඳහා SLSVP ලබා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කිරීම සඳහා ඉහත සඳහන් සමාගම සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව (SPMC) අතර ගිවිසුමක් සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද | ආවෘත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - සෞඛ්‍ය අමාත්‍යාංශයට තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.23 - පසු විපරම් කිරීම සඳහා අමතන ලද අතර එහිදී පැවසුවේ යොමු අංක (mh/pd/01/Gen.Misc/2022/volume1 ) යටතේ 2022.11.11 අතිරේක ලේකම් - පරිපාලන II වෙත අභ්‍යන්තරව යොමු කරන ලද බවයි.<br><br>තොරතුරු කෙටුම්පත් කිරීමට අතිරේක ලේකම් වැඩි කාලයක් ඉල්ලා සිටියේය. | සෞඛ්‍ය අමාත්‍යාංශය / ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | | | 2022.11.29 - පසුවිපරම් සඳහා අමතන ලද , නමුත් පිළිතුරක් නොලැබිණි.<br><br>2022.12.02 - පසු විපරම් කිරීමට අමතනු ලැබූ විට එම ඉල්ලීම ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා වෙත මාරු කර ඇති බවත්, එයට අදාළ ලිපිය වෙරිටේ වෙත තැපැල් කර ඇති බවත් දන්වා සිටියේය.<br><br>2022.12.02 - මාරු කිරීමේ ලිපියේ පිටපතක් WhatsApp හරහා ලැබිණි,<br><br>2022.12.09 - මාරු කිරීමේ ලිපිය තැපැල් මගින් ලැබිණි.<br><br>ඉන්පසු වැඩිදුර ලිපි ගනුදෙනුවක් සිදු නොවීය.<br><br>තොරතුරු නොලැබිණි | |
| සපුගස්කන්ද තෙල් පිරිපහදුවට බොරතෙල් සැපයීම | සපුගස්කන්ද තෙල් පිරිපහදුව සඳහා අවශ්‍ය බොරතෙල් 2022 ජූලි මාසය දක්වා සැපයීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් ගෙන තිබූ අතර එදිනෙන් ඔබ්බට අවශ්‍ය බොරතෙල් සැපයීමට කටයුතු කිරීමට සිදු විය. සපුගස්කන්ද පිරිපහදුව සඳහා බොරතෙල් සැපයීම සඳහා සයිප්‍රසයේ ටෙරා නෝවිස් සමූහය විසින් ඉල්ලීමක් රහිතව සිය කැමැත්තෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබිණ. | ආවෘත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - බලශක්තිය අමාත්‍යාංශය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.22 සහ 2022.11.23 - පසු විපරම් කිරීමට අමතන ලද අතර අමාත්‍යාංශයේ | බලශක්ති අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දින 180 ක දීඝර් ණය පදනමක් මත බොරතෙල් සැපයීම සඳහා ඉදිරිපත් කරන ලද ඉහත කී යෝජනාව කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගයීමට ලක් කර 450,000Bbls ක මූලික නැව්ගත කිරීමක් ලබා ගැනීමට නිදෙර්ශයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම කමිටුවේ නිදෙර්ශය පරිදි බොරතෙල් සැපයීම සඳහා බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | | | වෙනත් පුද්ගලයෙකු වෙත ඇමතුම යොමු කරන ලදී. කෙසේ වෙතත්, ඔවුන්ගේ සම්බන්ධතා තොරතුරු ලබා දෙනු නොලැබීය.<br><br>2022.12.05 - පසු විපරම් කිරීමට අමතන ලද අතර සතියකට පෙර අවශ්‍ය තොරතුරු වෙරිටේ වෙත තැපැල් කරන ලද බව දැනුම් දෙනු ලැබීය, කෙසේ වෙතත් තොරතුරු තැපැල මගින් නොලැබිණි. වෙරිටේ ඊමේල්/ෆැක්ස් මාගර්යෙන් පිටපතක් ඉල්ලා සිටියේය. ඒ සඳහා අමතර දින දෙකක කාලයක් ඉල්ලා සිටින ලදී.<br><br>2022.12.15 - බලශක්ති අමාත්‍යාංශය වෙත ගියද තොරතුරු නිලධාරියා මුණ ගැසීමට නොහැකි විය.<br><br>තොරතුරු නොලැබිණි | |
| මහවැලි නකල්ස් කාබනික කෘෂි කලාපය සඳහා කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදිකිරීම | මහවැලි අධිකාරී පනතේ විධිවිධාන අනුව අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් කාබනික කෘෂිකාමරීක නිෂ්පාදන නිපදවන තිරසාර සංවධර්න කලාපයක් ලෙස මොරගහකන්ද, කළුගඟ මහවැලි “F” කලාපය ප්‍රකාශයට පත් කරන ලදී. වස විස නැති කාබනික යෙදවුම් යොදා ගනිමින් කෘෂිකාමරීක බෝග නිෂ්පාදනය කිරීම තුළින් ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීමත්, කාබනික ගොවිතැන පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති ගොවීන්ගේ දායකත්වයෙන් ජාතික කාබනික කෘෂිකාමරීක බෝග නිෂ්පාදනයට අදාළ ඉලක්ක සපුරා ගැනීමත් අපේක්ෂා කරන ලදී. දීඝර්කාලීන බෝග වගාව සඳහා අවශ්‍ය කාබනික පොහොර එම කලාප තුළම නිෂ්පාදනය කිරීමේ අරමුණින් වැල්ලවාය සහ ගුරුවෙල මහවැලි කලාපවල අවශ්‍ය රසායනාගාර පහසුකම්වලින් සමන්විත කාබනික පොහොර | ආවෘත | හෙළිදරව් කර නොමැත | 2022.11.04 - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනුගත කරන ලදී.<br><br>2022.11.15 - තොරතුරු ඉල්ලීම සම්බන්ධව තොරතුරු මහවැලි අධිකාරිය සතු නොවන බැවින් වාරිමාගර් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බව පවසන ලිපියක් ලැබිණි.<br><br>2022.11.22 - වාරිමාගර් අමාත්‍යාංශය අමතන ලද අතර එහිදී පැවසුවේ ඉල්ලීම | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය / වාරිමාගර් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිෂ්පාදන අංගන දෙකක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. සැලැස්මේ පළමු අදියර ලෙස වැල්ලවාය කාබනික පොහොර නිෂ්පාදන අංගනය ස්ථාපිත කිරීමට තීරණය කළ අතර එම අංගනයෙන් වාෂරීකව පොහොර මෙ. ටොන් 2000ක් නිෂ්පාදනය කළ හැකි බවට පුරෝකථනය කරන ලදී. ඒ අනුව එම කාබනික පොහොර අංගනය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස ඉංජිනේරුමය කායර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කායර්ාංශය වෙත ලබාදීමට වාරිමාගර් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. | | | කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කරන්නට ඇති බවයි.<br><br>2022.11.24 - පසු විපරම් කිරීමට අමතන ලද නමුත් කිසිදු යාවත්කාලීනයක් නොලැබිණි.<br><br>2022.11.29 - පසුවිපරම් සඳහා කිහිප වරක්ම අමතන ලද නමුත් පිළිතුරක් නොලැබිණි.<br><br>2022.12.08 - නැවතත් කිහිප වරක්ම ඇමතීමට උත්සාහ කරන ලද නමුත් පිළිතුරක් නොලැබිණි.<br><br>2022.12.09 - තොරතුරු දැනගැනීමේ ඉල්ලීම අභ්‍යන්තරව අතිරේක ලේකම් (වාරි මාගර් සහ ජල සම්පත් කළමනාකරණ) වෙත යොමු කරන ලද පවසන්මින් 2022.11.04 දින යෙදූ ලිපියක් ලැබිණි. ඉන්පසු කිසිදු ලිපි හුවමාරුවක් සිදු නොවීය.<br><br>තොරතුරු නොලැබිණි | |
| භාවිතයට නොගත් රජයේ ඉඩම් කැබලි කෘෂිකාමරීක කටයුතු සඳහා යොදා ගැනීමේ වැඩසටහනක් හරහා ආහාර හිඟය විසඳීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටු පත් කිරීම. | 2022.05.19 දින ශ්‍රී ලංකා පාලරීමේන්තුවේ හැන්සාඩ් පත්‍රයේ පිටු අංක 17 හි සඳහන් පරිදි ආහාර හිඟකම පිළිබඳ ගැටලුව විසඳීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටු පත් කිරීමට ගරු රනිල් වික්‍රමසිංහ මහතා යෝජනා කර ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ රජය සතු හිස් ඉඩම් කෘෂිකාමරීක කටයුතු සඳහා යොදා ගැනීමට සහය දක්වන ලෙස කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් | ආවෘත<br><br>තොරතුරු ලැබුණේ 2022.12.26 දින වූ අතර (තොරතුරු ඉල්ලීම ගොනුගත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත තොරතුරු දැනගැනිමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසු විපරම් කිරීමට අමතන ලද අතර කෘෂිකමර් දෙපාතර්මේන්තුවට අදාළ තොරතුරු නොමැති බැවින් | කෘෂිකමර් දෙපාතර්මේන්තුව /<br><br>කෘෂිකමර් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඔහු විශේෂයෙන් ඉල්ලා සිටියේය. මෙම ව්‍යාපෘතිය කෘෂිකමර් අමාත්‍යාංශයේ භාරයට පත් කරන ලදී. අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේ අවිස්සාවේල්ල සහ හෝමාගම කොටසක් හැර කොළඹ අනෙකුත් සියලුම ප්‍රදේශවල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු බවයි. ඉන්පසු සතියේ පැවැත්වෙන අදාළ පාලරීමේන්තු මන්ත්‍රීවරුන්ගේ සාකච්ඡාවේදී යෝජිත වැඩසටහන සම්බන්ධව අවසන් තීරණය ගැනීමට නියමිතව තිබිණි. | කරන ලද්දේ 2022.11.04), තොරතුරු දින 14 කින් පසුව (දින 21 කින්) ලැබුණු නිසා ප්‍රමාද වූ ප්‍රතිචාරයක් ලෙස සැලකේ. | | තොරතුරු දැනගැනීමේ ඉල්ලීම කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කෙරෙනු ඇති බව දනවන ලදී.<br><br>2022.11.22 - කෘෂිකමර් අමාත්‍යාංශය අමතන ලද අතර ඔවුන්ට ඉල්ලීම ලැබුණු බවත් අදාළ අතිරේක ලේකම්වරයා තොරතුරු කෙටුම්පත් කරනලද බවත් දැනුම් දෙනු ලැබීය.<br><br>2022.11.25 - අභ්‍යන්තර යොමු ලිපියේ පිටපතක් වෙරිටේ වෙත ලැබිණි.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට අමතන ලද අතර ඉල්ලන ලද තොරතුරු සැපයීමට තවත් සතියක කාලයක් ඉල්ලා සිටින ලදී.<br><br>2022.12.05 - පසු විපරම් කිරීමට අමතන ලද අතර, එම කටයුතු පවරා ඇති නිලධාරීන් දෙදෙනෙකු තොරතුරු කෙටුම්පත් කිරීම අවසන් කර ඇති බවත්, ඔවුන් 2022.12.09 වන විට තොරතුරු ඉල්ලීම් හතරටම ප්‍රතිචාර එවන බවත් දැනුම් දෙන ලදී.<br><br>2022.12.09 - කෘෂිකමර් අමාත්‍යාංශය ඇමතීමට උත්සාහ කරනු ලැබුවද ප්‍රතිචාරයක් නොලැබිණි.<br><br>2022.12.13 - පසු විපරම් කිරීමට අමතන ලද අතර, එම කටයුතු පවරා ඇති එක් නිලධාරියෙකු තොරතුරු කෙටුම්පත් අවසන් කරන තෙක් සිටින බවත්, ඔවුන් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.14 වන විට තොරතුරු ඉල්ලීම් හතරටම ප්‍රතිචාර එවන බවත් දැනුම් දෙන ලදී.<br><br>2022.12.14 - පසුවිපරම් සඳහා කිහිප වරක්ම අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි. ඉන්පසු අපි සන්නිවේදනය නවතා දැමූවෙමු.<br><br>2022.12.26 - තැපැල් මගින් තොරතුරු ලැබිණි. | |
| '''එක්ව වවමු-රට දිනවමු'' - ජාතික බෝග නිෂ්පාදන මෙහෙයුම | රට තුළ මතුව ඇති ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අබර්ුදයට කඩිනම් විසඳුමක් ලෙස කෘෂිකමර් අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන, අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.එක්ව කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහනක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෘෂිකමර් දෙපාතර්මේන්තුවේ සහ පළාත් කෘෂිකමර් දෙපාතර්මේන්තුවල තාක්ෂණික දායකත්වයෙන් කෘෂිකමර් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් සම්පූණර් වැඩසටහන සිදු කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව එක්ව වවමු රට දිනවමු'- ජාතික බෝග නිෂ්පාදන ව්‍යාපාරය, බෞද්ධ විහාරස්ථාන සහ ආගමික ස්ථාන, ක්‍රිස්තියානි පල්ලි, මුස්ලිම් පල්ලි සහ හින්දු කෝවිල්වලට අයත් හෙක්ටයාර් 250,000 ක පමණ ඉඩම් ප්‍රයෝජනයට ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා සහ කෘෂිකමර් අමාත්‍යාංශය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව | ආවෘත<br><br>2022.12.26 දින එනම් තොරතුරු ඉල්ලීමේ ප්‍රතිචාර ලබාගැනීමේ අවසන් දිනයෙන් පසුව තොරතුරු ලැබිණි. | හෙළිදරව් කර නොමැත | 2022.11.04 - කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත තොරතුරු දැනගැනිමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - පසු විපරම් කිරීමට අමතන ලද අතර කෘෂිකමර් දෙපාතර්මේන්තුවට අදාළ තොරතුරු නොමැති බැවින් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම කෘෂිකමර් අමාත්‍යාංශයට යොමු කෙරෙනු ඇති බව දනවන ලදී.<br><br>2022.11.22 - කෘෂිකමර් අමාත්‍යාංශය අමතන ලද අතර ඔවුන්ට ඉල්ලීම ලැබුණු බවත් අදාළ අතිරේක ලේකම්වරයා තොරතුරු කෙටුම්පත් කරනලද බවත් දැනුම් දෙනු ලැබීය. | කෘෂිකමර් දෙපාතර්මේන්තුව / කෘෂිකමර් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. | | | 2022.11.25 - අභ්‍යන්තර යොමු ලිපියේ පිටපතක් වෙරිටේ වෙත ලැබිණි.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට අමතන ලද අතර ඉල්ලන ලද තොරතුරු සැපයීමට තවත් සතියක කාලයක් ඉල්ලා සිටින ලදී.<br><br>2022.12.05 - පසු විපරම් කිරීමට අමතන ලද අතර, එම කටයුතු පවරා ඇති නිලධාරීන් දෙදෙනෙකු තොරතුරු කෙටුම්පත් කිරීම අවසන් කර ඇති බවත්, ඔවුන් 2022.12.09 වන විට තොරතුරු ඉල්ලීම් හතරටම ප්‍රතිචාර එවන බවත් දැනුම් දෙන ලදී.<br><br>2022.12.09 - කෘෂිකමර් අමාත්‍යාංශය ඇමතීමට උත්සාහ කරනු ලැබුවද ප්‍රතිචාරයක් නොලැබිණි.<br><br>2022.12.13 - පසු විපරම් කිරීමට අමතන ලද අතර, එම කටයුතු පවරා ඇති එක් නිලධාරියෙකු තොරතුරු කෙටුම්පත් අවසන් කරන තෙක් සිටින බවත්, ඔවුන් 2022.12.14 වන විට තොරතුරු ඉල්ලීම් හතරටම ප්‍රතිචාර එවන බවත් දැනුම් දෙන ලදී.<br><br>2022.12.14 - පසුවිපරම් සඳහා කිහිප වරක්ම අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි. ඉන්පසු අපි සන්නිවේදනය නවතා දැමුවෙමු. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.26 - තොරතුරු ලැබිණි. | |
| ගෘහ ඒකකවලට කෘෂි බීජ බෙදා හැරීම | 2022.01.19 දින ශ්‍රී ලංකා පාලර්මේන්තුවේ හැන්සාඩ් පත්‍රයේ පිටු අංක 44 හි සඳහන් පරිදි ගරු ගුණතිලක රාජපක්ෂ මහතා ප්‍රකාශ කර ඇත්තේ තම ගෙවත්තේ එළවළු සහ පලතුරු වගා කිරීම දිරිමත් කිරීම සඳහා ගෘහ ඒකක මිලියන 20කට කෘෂි බීජ බෙදා හැරීමට අයවැයෙන් රුපියල් මිලියන 85,000ක් වෙන් කර ඇති බවයි. | ආවෘත<br><br>අමාත්‍යාංශවලින් තොරතුරු භාරගැනීමේ කාලය අවසන් වූ පසු තොරතුරු ලබා දෙන ලදී. | හෙළිදරව් කර නොමැත | 2022.11.04 - කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ඉදිරිපත් ලදී.<br><br>2022.11.15 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර කෘෂිකමර් දෙපාතර්මේන්තුව තමන්ට දත්ත නොමැති හෙයින් ඉල්ලීම කෘෂිකමර් අමාත්‍යාංශය වෙත යොමු කරන බව පවසා සිටියේය.<br><br>2022. 11.22 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර අතිරේක ලේකම් තොරතුරු කෙටුම්පත් කරන බව ප්‍රකාශ කළේය.<br><br>2022.11.29 - පසු විපරම් කිරීමට අමතන ලද අතර ඉල්ලන ලද තොරතුරු සැපයීමට තවත් සතියක කාලයක් කෘෂිකමර් අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ලදී.<br><br>2022.12.05 - පසු විපරම් කිරීමට අමතන ලද අතර ප්‍රතිචාර කෙටුම්පත් කරන බවත් 2022.12.09 වන විට ප්‍රතිචාර එවන බවටත් දැනුම් දෙන ලදී.<br><br>2022.12.13 - පසු විපරම් කිරීමට ඇමතු අතර කෘෂිකමර් අමාත්‍යාංශය දන්වා සිටියේ සමහර තොරතුරු තවමත් ඉතිරිව ඇති බවත් 2022.12.14 වන විට එවන බවත්ය. | කෘෂිකමර් දෙපාතර්මේන්තුව / කෘෂිකමර් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.14 - පසුවිපරම් සඳහා කිහිප වරක්ම අමතන ලද නමුත් ප්‍රතිචාරයක් නොලැබිණි. ඉන්පසු අපි සන්නිවේදනය නවතා දැමූවෙමු<br><br>2022.12.26 - තැපැල් මගින් තොරතුරු ලැබිණි. | |
| බන්ධනාගාර දෙපාතර්මේන්තුව සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කායර්ාංශය විසින් දියත් කරන ලද කෘෂිකාමරීක බෝග වගා වැඩසටහන් | බන්ධනාගාර රැඳවියන් හුදෙක් ඔවුන් සිර මැදිරි තුළ රඳවා තබා ගැනීමෙන් තොරව ඔවුන්ගේ ශ්‍රම දායකත්වය රටේ කෘෂිකාමරීක සංවධර්නය සඳහා ලබාගෙන ඔවුන් ජාතියේ මානව සම්පත බවට පත්කිරීමේ අරමුණින් “සරුසාර - බන්ධනාගාරයෙන් ගොවිපළට” නමින් බෝග වගා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට බන්ධනාගාර දෙපාතර්මේන්තුව සැලසුම් කර ඇත. කෘෂිකමර් දෙපාතර්මේන්තුවේ මගපෙන්වීම යටතේ විවෘත බන්ධනාගාර කඳවුරුවල සහ වැඩකරන සිර කඳවුරුවල ඉහළ අස්වැන්නක් ලබා දෙන බෝග වගා කිරීමටත්, එමගින් ලැබෙන අස්වැන්න රැඳවියන්ගේ ආහාර සඳහා යොදා ගැනීමටත් මෙම වැඩසටහන මගින් අපේක්ෂා කරන ලදී. ඊට අමතරව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කායර්ාංශය විසින් පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනක් යටතේ කෘෂිකාමරීක සංවධර්න වැඩසටහන් ආරම්භ කර තිබුණි. එම කෘෂිකාමරීක කටයුතු තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සහ ජාතික පශු සම්පත් සංවධර්න මණ්ඩලයට අයත් නැගෙනහිර පළාතේ කන්දකාඩු සහ නවසේනපුර යන ප්‍රදේශවල වගා නොකළ ඉඩම් අක්කර 1000ක් ලබාගෙන පුනරුථාපනය වන පුද්ගලයන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉන් අක්කර 500 ක භූමි ප්‍රමාණයක බඩඉරිඟු වගා කිරීමට සහ ඉතිරි ඉඩම් කොටසෙහි ප්‍රදේශයට ආවේණික ධාන්‍ය, එළවළු සහ පලතුරු වගා කිරීමට සැලසුම් කර තිබුණි. අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා | ආවෘත | හෙළිදරවු කර නොමැත | 2022.11.04 - අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, බන්ධනාගාර දෙපාතර්මේන්තුව සහ කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත තොරතුරු දැනැගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.08 - බන්ධනාගාර දෙපාතර්මේන්තුවෙන් ඇමතුමක් ලද අතර එමගින් දැනුම් දෙනු ලැබුවේ එම වැඩසටහන පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කායර්ාංශය විසින් හසුරුවන බැවින් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප විය හැකි බවයි. වෙරිටේ විසින් තොරතුරු ඉල්ලීම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කායර්ාංශය වෙත මාරු කරන ලෙස ඉල්ලා සිටියේය.<br><br>2022.11.11 - ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව දන්වමින් 2022.11.09 දින යෙදූ ලිපියක් ලැබිණි.<br><br>2022.11.15 - අධිකරණ අමාත්‍යාංශය අමතන ලද අතර තොරතුරු ඉල්ලීම බන්ධනාගාර දෙපාතර්මේන්තුවට යොමු කරන ලද බව දැනුම් දෙන ලදී. අධිකරණ අමාත්‍යාංශය එම යොමු ලිපිය වෙරිටේ | අධිකරණ අමාත්‍යාංශය, බන්ධනගාර කටයුතු සහ ව්‍යවස්ථා සංශෝධන / බන්ධනාගාර දෙපාතර්මේන්තුව / කෘෂිකමර් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද එම වැඩසටහන් පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලයේ අවධානයට ලක් විය. | | | වෙත එවීය. (කෙසේ වෙතත්, බන්ධනාගාර දෙපාතර්මේන්තුව විසින්ම ඉල්ලීම දැනටමත් යොමු කර ඇති බැවින් මෙය අදාළ නොවේ)<br><br>2022.11.16 - බන්ධනාගාර දෙපාතර්මේන්තුව ඇමතීමේදී එම යොමු කිරිම එදිනෙම සිදුවූ බව දැනුම් දෙනු ලැබීය.<br><br>2022.11.22 - පසුවිපරම් කිරීමට අමතන ලද අතර පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කායර්ාංශයට බන්ධනාගාර දෙපාතර්මේන්තුවෙන් තොරතුරු ඉල්ලීම ලැබී නොමැති බව දැනුම් දෙනු ලැබීය.<br><br>2022.11.24 - 2022.11.17 දිනැතිව බන්ධනාගාර දෙපාතර්මේන්තුවෙන් ලිපියක් ලැබිණි. කායර්ාංශයෙන් පසුවිපරම් කිරීමේදී දැනුම් දෙන ලද්දේ 2022.11.22 යොමු කළ ඉල්ලීම ඔවුන්ට ලැබුණු බවත් තොරතුරු කෙටුම්පත් කිරීම සඳහා අදාළ නිලධාරියා වෙත ඉල්ලීම අභ්‍යන්තරව යොමු කර ඇති බවත් ය.<br><br>2022.11.30 - කායර්ාංශයෙන් ඇමතුමක් ලැබුණු අතර, අමාත්‍ය මණ්ඩල යෝජනාව අප මුලින් තොරතුරු ඉල්ලීම් ගොනු කළ බන්ධනාගාර දෙපාතර්මේන්තුව සහ අධිකරණ අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින බව දන්වන ලදී. කෙසේ වෙතත්, කායර්ාංශය ඔවුන් සතුව ඇති අදාළ තොරතුරු අපට ලබා දීමට එකඟ විය. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2022.12.08 - කායර්ාංශයට කතා කර, ඉල්ලා සිටින තොරතුරු I/O වෙත අභ්‍යන්තරව යවා ඇති බවත්, ඔවුන් දින කිහිපයකින් අපව යාවත්කාලීන කරන බවත් දන්වන ලදී. කායර්ාංශයෙන් වැඩි දුර ප්‍රතිචාර කිසිවක් නොලැබිණි.<br><br>තොරතුරු නොලැබිණි | |
| අක්‍රිය වී ගොවි ණය කපා හැරීම | ප්‍රධාන වශයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය සහ ඉන් පසුව ඇති වූ කෝවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික අබර්ුදය ක්‍රමානුකූලව නරක අතට හැරෙමින් සෑම අංශයකටම සෘජුව සහ වක්‍රව දැඩි ලෙස බලපෑම් කරමින් ඇත. සමස්ථ ජනගහනයෙන් ආසන්න වශයෙන් 30% ක් පමණ වන ගොවි ප්‍රජාවට එයට මුහුණ දීමට නොහැකි වූ අතර රසායනික පොහොරවලින් කාබනික පොහොර වෙත යාමට තීරණය කිරීම නිසා ඔවුන් මුහුණ දුන් දුෂ්කරතා තවත් උග්‍ර විය. මෙම තත්ත්වය යටතේ ගොවීන් වී වගාව සඳහා ලබා ගත් ණය පියවීමට නොහැකි වූ අතර එම ණය බැංකු විසින් අක්‍රීය ණය ලෙස වගර් කරන ලදී ගෙවීමට ඇති වෙනත් ණය හේතුවෙන් ඉදිරි මහ කන්නයේදී වී වගාව සඳහා වෙනත් ණය ලබාගැනීමට බොහෝ ගොවීන්ට නොහැකි වන නිසාවෙන් එම ගොවියන්ට සහන සැලසීමට රජයේ මැදිහත් වීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව මුදල්, ආර්ථික ස්ථායිතාව සහ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධව වග කියන ඇමතිවරයා වශයෙන් අගමැතිවරයා, හෙක්ටයාර දෙකට වැඩි හෝ අඩු ඉඩම්වල වී වගා කිරීමට රජයේ බැංකුවලින් ලබාගත් ගෙවීමට අසීරු ණයවල මූලික මුදල කපා හැරීමට කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | විවෘත<br><br>ව්‍යාපෘතියේ කාලසීමාව සහ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව තොරතුරු සපයන ලදී. | ඉටු කරන ලදී<br><br>2022.11.21 වන විට, ප්‍රතිපාදන කාලෝචිත ලෙස වියදම් කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතිය එහි ඉලක්කයෙන් 81.5% දක්වා ළඟා වී ඇති අතර ජනගහනයේ ඉලක්ක කණ්ඩායම සම්බන්ධයෙන් එහි ඉලක්කයෙන් 91.2% දක්වා ළඟා විය.<br><br>86.3% ක ප්‍රගතියක් ලබා ඇති බව ඇගයීම් මගින් තීරණය කළේය. | 2022.11.04 - මුදල්, ආර්ථික ස්ථායීතාව සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදී.<br><br>2022.11.15 - ඉල්ලන ලද තොරතුරු සපයන ලෙස දන්වමින් අමාත්‍යාංශය වෙතින් සංවධර්න මූල්‍ය දෙපාතර්මේන්තුවට යවන ලද ඊමේලයේ පිටපතක් ඊමේල් මාගර්යෙන් ලැබිණි.<br><br>2022.11.22 - යොමු කරන ලද ඉල්ලීම ඔවුන්ට ලැබී ඇති බවත් තොරතුරු ලබා දෙන බවත් සංවධර්න මූල්‍ය දෙපාතර්මේන්තුව අපට දන්වා සිටියේ ය.<br><br>29.11.2022 - තොරතුරු Verité වෙත යැවීමට සූදානම් බව සංවධර්න මූල්‍ය දෙපාතර්මේන්තුව අපට දැනුම් දුන්නේය. තොරතුරුවල මෘදු පිටපතක් එදිනම ඊමේල් හරහා එවන ලදී.<br><br>2022.12.09 - තැපෑලෙන් එහි දෘඪ පිටපත ලැබිණි. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |

## වගකීම්හරණය

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු රජයේ වාතර්ා, නිල ප්‍රකාශන, මහජන වාතර්ා සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් ඔස්සේ ලැබෙන තොරතුරු ඇසුරින් සම්පාදනය කර ඇත. මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු වෙරිටේ රිසච් ආයතනයේ හෝ එහි සාමාජිකයින්ගේ හෝ පෞද්ගලික අදහස් හෝ මතය පිළිබිඹු නොකරයි. වේදිකාවේ ඇතළත් තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි හෝ එසේ වූ බවට කියැවෙන කිසිදු අලාභයකට හෝ කීතර්ී නාමයට හානි කිරීම ඇතුළුව කිසියම් අලාභයක් හෝ හානියක් සඳහා වෙරිටේ රිසච් ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

මෙම වේදිකාවේ පළ කර ඇති තොරතුරු විශ්වාසදායක ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර, තොරතුරුවල ඇති කිසිදු දෝෂයකට, මගහැරීමකට හෝ එම තොරතුරු භාවිතයෙන් ලබාගත් ප්‍රතිඵල සඳහා හෝ වෙරිටේ රිසච් සහ budgetpromises.org කණ්ඩායමෙහි සාමාජිකයින් වගකිව යුතු නොවේ. වෙරිටේ රිසච් ආයතනයේ පූවර් ලිඛිත අවසරයකින් තොරව මෙම වේදිකාවේ අන්තගර්තයන් වෙනස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම, සම්ප්‍රේෂණය කිරීම, හුවමාරු කිරීම, විකිණීම, පිටපත් කිරීම, ව්‍යුත්පන්න කෘති නිමර්ාණය කිරීම, බෙදා හැරීම, නැවත පළ කිරීම, රඟ දැක්වීම, ප්‍රදශර්නය කිරීම සහ කිසිදු ආකාරයකින් වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට අවසර නොමැත.

එමෙන්ම, වෙරිටේ රිසච්හි පූවර් අවසරය ඇතිව හෝ නැතිව, පූවර්යෙන් ලබාගත් තොරතුරක් පසුකාලීනව භාවිතා කිරීමෙන් උද්ගතවන ප්‍රතිඵල සඳහා budgetpromises.org වගකිව යුතු නොවේ.

budgetpromises.org කිසිදු දේශපාලන පක්ෂයක් සහ / හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත සංවිධානයක් වෙත සහය දැක්වීම, අනුමත කිරීම, නියෝජනය කිරීම සහ ඒ සමඟ සම්බන්ධ වීම ආදිය සඳහා කටයුතු නොකරයි. විශ්ලේෂණ සඳහා භාවිතා කෙරෙන දශර්ක හුදෙක් කායර් සාධනයේ සංඛ්‍යානමය අනුමානයන් පමණකි.

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු පරිශීලකයින් දැනුවත් කිරීම සඳහා නොමිලයේ  සපයනු ලැබේ. එම තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වෙරිටේ රිසච් හෝ budgetpromises.org කණ්ඩායමේ සාමාජිකයින් සහ කිසියම් පරිශීලකයෙකු අතර එකඟතාවයක් හෝ අවබෝධතාවක්  නොපවතී.

මෙම වේදිකාව, දත්ත මගින් ප්‍රදශර්නය කෙරෙන ප්‍රවණතා දැක්වීමට සහ ඒවා පිළිබිඹු කිරීමට budgetpromises.org විසින් සකස් කරන ලද ස්වාධීන විශ්ලේෂණ ලිපිවලින් සමන්විත වේ. එවැනි විශ්ලේෂණ ලිපි පිටපත් කිරීම වෙරිටේ රිසච් හි පූවර් අවසරය ඇතිව සිදු විය යුතුය.